නිපුණතාව 16 - ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත සඵලදායකව සහ කාර්යක්ෂමව යොදා ගන්නා අයුරු විමසයි.

නිපුණතා මට්ටම 16.1 - මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම හා එහි කාර්යය විමසයි.

## මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් කළමනාකරණය යනු ,

සංවිධානයක පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා වඩා යෝග්‍ය හා තෘප්තිමත් මානව සම්පත් ජනිත වන අයුරෙන් ආයතනයේ මානව සම්පත සඵලදායීව හා කාර්යක්ෂමව ලබා ගැනීම හා රඳවා ගැනීම සම්බන්ධ ක්‍රියාකාරකම් සමුදාය "මානව සම්පත් කළමනාකරණය" ලෙස හැඳින්විය හැකිය.

### සෙසු සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතෙහි සුවිශේෂතාව

- සජීව සම්පතක් වීම.
- සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකි වීම.
- සෙසු සම්පත් පාලනය කළ හැකි වීම.
- පුහුණු කිරීමෙන් අගය වැඩි වීම.
- කණ්ඩායම් වශයෙන් කටයුතු කළ හැකි වීම.
- චර්යා සංකීර්ණ වීම හා පුරෝකථනය කළ නොහැකි වීම.
- නිර්මාණාත්මක හැකියා සහිත වීම.

මානව සම්පත් කළමනාකරණයේ පොදු පරමාර්ථ පහත පරිදි දැක්විය හැකිය.

- සංවිධානයේ සාර්ථකත්වය සඳහා උපරිම දායකත්වයක් ලබා දෙන යෝග්‍ය හා තෘප්තිමත් සේවාදායකයන් ඇති කර ගැනීම හා රඳවා ගැනීම.

### අභ්‍යාස

1. මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම පෙන්වා දෙන්න.
2. මානව සම්පත් කළමනාකරණ කාර්යයන් ලැයිස්තුගත කරන්න.